6 මට හැඟෙන අයුරින් රසිකොලොජිය
rasikalogy.blogspot.com

# මරණ දඬුවම ද මිනීමැරුමකි

## STOP KILLING HUMANS IN THE NAME OF LAW

අප නිජභූමිය වූ ශ්‍රී ලංකාවේ මෙන්ම, අප වසන ඕස්ට්‍රේලියාවේ ද මරණ දඬුවම ක්‍රියාත්මක කිරීම නතර කර දිගු කලකි. ඕස්ට්‍රේලියාවේ අවසන් වරට මරණ දඬුවම ක්‍රියාත්මක කර ඇත්තේ 1967 දී වන අතර, 1973 දී මරණ දඬුවම නීති පොතෙන් සදහට ම ඉවත් කර ඇත.

ශ්‍රී ලංකාවේ තත්වය තරමක් වෙනස් ය. අවසන් වරට මිනිසෙකු නීතියේ ආවරණය මැද එල්ලා මරා ඇත්තේ 1975 දී වන නමුත්, මරණ දඬුවම නීත්‍යානුකූල දඬුවමක් ලෙස තවමත් පවතී.

මරණ දඬුවම පිළිබඳව ඕස්ට්‍රේලියාව තුළ අවසන්වරට කතිකාවක් ඇතිවුණේ මීට තෙවසරකටත් ඉහත ඉන්දුනීසියාව තුළ දී මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ වරදට අත් අඩංගුවට ගත් ඕස්ට්‍රේලියානු ජාතිකයින් නම දෙනා ගේ නායකින් යැයි සැලකෙන මයුරන් සුකුමාරන් සහ ඇන්ඩෘ චැන්ග් යන දෙදෙනා, ඒ සිදුවීමෙන් වසර දහයකට පසුව, නඩු තීන්දුවේ ප්‍රකාර වෙඩි තබා මරා දැමූ අවදියේ දී ය. එදා ඉන්දුනීසියාවේ දී, ඒ වරදට ම අසුවී නඩු අසා මරණ දණ්ඩනයට නියම කරන ලද තවත් විජාතිකයින් හය දෙනෙකුට ද ඒ ඉරණම හිමිවිය. නොබෝදා ශ්‍රී ලංකාවෙන් අසන්නට ලැබුණු පුවත්වලින් කියවුණේ මරණ දඬුවම යළිත් ක්‍රියාත්මක කිරීම පිළිබඳ විධායක තීරණයක් ද නොබෝදා ගන්නා ලද බවකි. එයට ආසන්නම හේතුව ලෙස දැක්වෙනුයේ ද මත්ද්‍රව්‍ය බෙදාහැරීමේ සමාජ විරෝධී ජාවාරම් ය.

මත්ද්‍රව්‍ය යනු මිනිස් ජීවිත විනාශ කරන දෙයකි. එ නිසා, ඒවා නිෂ්පාදනය, බෙදා හැරීම සහ විකිණීම සාපරාධී ක්‍රියා බව අමුතුවෙන් කිව යුතු නැත. නමුත් මරණ දඬුවම, ඒ වරදට සුදුසු ද?

සාමාන්‍යයෙන් මරණ දඬුවම නියම වෙන්නේ අඩු වශයෙන් එක් මිනිසෙකු හෝ මරා දැමීමේ සාපරාධී ක්‍රියාවට ය. මිනිසෙකු තවත් මිනිසෙකු මරා දැමීම වරදක් නම්, ඒ වරදට දඬුවම ලෙස වරද කළ අය මරා දැමීම ද නිවැරදි නොවේ. කවර නෛතික පදනමක් තිබුණ ද, එයද මිනීමැරුමක් ම වේ!

මිනිස් ශිෂ්ටාරයේ මුල සිට පැවත ගෙන එන



An Execution by an Eliphant.

නමුත් මරණ දඬුවම අද වන විට නොදියුණු සමාජයක ලක්ෂණයක් ලෙස පෙන්විය හැකි නීතියකි. මේ විසි එක්වන සියවස වන විට බොහෝ ශිෂ්ට සමාජවලින් මරණ දඬුවම එක්කෝ නීතියෙන් ම ඉවත් වී තිබේ, නැතිනම්, ක්‍රියායත්මක කිරීම අත් හිටුවා ඇත.

විකිපීඩියාවට අනුව, අද වන විට ලෝකයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් රටවල් 195 අතරින් රටවල් 105 ක් ම මරණ දඬුවම ලබාදීම සහමුලින් ම නතර කර දමා ඇත. තවත් රටවල් 36 ක එය තවදුරටත් නීතිගතව තිබුණ ද ක්‍රියාත්මක වීම එක්කෝ අත් හිටුවා ඇත, නැතිනම් වසර දහයකින් මෙපිට ක්‍රියාත්මක කර නැත.

ඒ අනුව මරණ දඬුවම ක්‍රියාත්මක වන්නේ රටවල් 54 ක පමණකි. මේ රටවල් අතරට චීනය, ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය (ජනපද 50 න් 32 ක්) හා ඉන්දුනීසියාව යන ලෝකයේ වැඩිම ජනගහනයෙන් යුතු රටවල් හතර අයිතිවීම නිසා ලෝක මිනිස් ප්‍රජාවෙන් 60%ක් තවමත් මේ තිරිසන් නීතිය යටතේ ජීවත්වෙන බව කිව හැක. පසුගිය වසරේ වැඩිම පිරිසක් මරණ දවුවම ලබා ඇත්තේ



One Impaled on a Stake.

චීනයේ යි. එය දහසකට වැඩි සංඛ්‍යාවකි. ලයිස්තුවේ ඊළඟට සිටින රටවල් පිළිවෙලින් ඉරානය, සෞදි අරාබිය, ඉරාකය, පකිස්ථානය, ඊජිප්තුව, ඇමරිකා එක්සත් ජනපදය, සෝමාලියාව, බංගලා දේශය සහ මැලේෂියාව වේ.

මිනිසුන් නම් සත්ව කොට්ඨාසය සහමුලින්ම ශිෂ්ටාචාර වූ බව සැලකිය හැකිවෙන්නේ මරණ දඬුවම සහමුලින්ම ලෝකයෙන් තුරන් වූ දිනයට බව මගේ අදහසයි. මැද පෙරදිග සිදුවෙන "අයිසිස්" ආකාරයේ මිනීමැරුම් ගැන සිතන විට ඒ දිනය කල්ප ගණනක් දුර බව කණගාටුවෙන් වුවද කිව යුතුය.

අපේ සමහර අයියලා ද, එක කටකින් මිනිස් අයිතිවාසිකම් ගැන කතා කරමින්, අනිත් කටෙන් මරණ දඬුවම ක්‍රියාත්මක කිරීම සාධාරණීකරණය කරමින් කතා කරනවා පසුගිය දිනවල දැකිය හැකි විය.

මෙහි දී සඳහන් කළ යුතු ජුගුප්සාජනකම උදාහරණ නම් බෞද්ධ යැයි කියාගන්නා උන්නැහෙලාගේ සහ උන්නාන්සේලාගේ ද, යහපාලනයේ බැටළුහම් පැළඳි දේශපාලුවන්ගේ ද, විශේෂයෙන් බුද්ධ ශාසන ඇමතිකමේ ද කටයුතු කර ඇති උං ගේ ද ක්‍රියාකලාපයයි. ඒ සමහරවිට ලංකාව " බෞදියක්" කිරීමේ වැඩපිළිවෙලේ කොටසක් විය හැක.
අවසාන වශයෙන් කිව යුත්තේ මෙයයි. නීති විරෝධී මරණ සහ නීත්‍යානුකූල මරණ කියා වර්ග දෙකක් ලොව තිබිය නොහැක. මිනිසෙකු මරා දැමීමේ වරදට දඬුවම ලෙස ඒ මිණීමරුවාව මරා දැමෙන්නේ නම් එවිට සිදුවන්නේ මුල් මිනීමැරුම සාධාරණීකරණය වීමකි.

කොටින් ම, මරණ දඬුවම ද මිනීමැරුමකි!

රසිකොලොජිස්ට්
(rasikalogy.blogspot.com)

# හිරු උදාවයි ගමේ අසිරියයි

ගිරි හෙල් තැනිතලා ජලතලා
වසා සිටි අඳුරු දුහුල් කඩ
ඉරා දමා
තෙද බල විකුම් පාමින්
දිනපති සිනාපාමින්
කෙමෙන් නැගී එයි
ලහිරු රැස් විහිදුවමින්
නිදි පැදුරෙන් පිබිදෙන්න
ඇරයුමක් කරන්නාසේ
කපුටු රැල කාක්! කාක්! නදින්
රැව් පිලි රැව් දේ
ගෙමිදුලේ, වන වදුලේ, වතු පිටියේ
තුරු ලතා ප්‍රීතියෙන් උදම් වී
සිලි සිලි හඬ දෙමින්
මනරම් නැටුමක් පානවා
නිශාකතට බියවී ගුලි වී සිටි
සකුණා කැළ
හිරුගේ දසුන දැක
ප්‍රබෝදයෙන් කැදලි තුලින් පිටවී
දසත පියසලමින්
සංගීතයට පණ පොවයි
ගීතයේ මිහිරි නදින්
විල්තෙර අසබඩ
ගොදුරක් පතමින්
කොක්කු රැල බලා සිටී
සිල්ගත් විලසින් ශාන්තව
අවු රැස් වලල්ලෙන්
ගත සිත සර්තපන කර ගන්න
යොද කිබුලෝ
ගල් තලාවේ
වැතිර සිටියත්
අවට සංසුන්ය කිසිවෙකුගේ බාධාවක්
නෑ උන්ට
හිරු රැස් පහස විද
මානෙල් නෙලුම් ඕලු
ජල තලයේ සිසිල විඳ
හෙමින් හෙමින් හිනහෙයි
සුවඳ දසත විහිදුවමින්
සුවඳින් මත්ව මී මැසි බඹර කැල
මල් මත වැදී තුටින්
මතරන්දයෙන් මත් වී
ගුම් හඬ නඟති ගීතයක් ලෙසින්
උම්බෑ කිය කියා වසු පැටියා
ගොපල්ලාට හඬගසන්නේ
නිල්ලට යෑමට කාලය
උදාවූ බව හඟවමින්ය
වස්දඬුව ගෙන ගොපලු
දරුවා සැරසෙයි උම්බෑ අණට කීකරු
වූවාසේ
ගෙවිලිය කළය ගෙන
කුඹුකේ ලිඳ ලඟට ඇදෙනවා
ලැසි ගමනෙන්
දුම් දමන කෝපි කෝප්පය බී
හෙප්පුවේ බුලතින් සප්පායම් වී
කෙතට පා තබයි
ගොවියා අරුනළු මැද්දේ
ශීත මද නල අස්නේ
සිප්සත අම්ල ධනයක් යන වදනට
සිත් යොමා
අකුරු කරනට
ගුරු ගෙදරට පා පොඩි තබන දරුවෝ
කිරි කොක්කු රෑනක් මෙන්ය
නගර බලා රැකියාවට ඇදෙනා
සේවකයෝ ගමේ හංදියේ
මාර ගහ යටට කඩි රැලක් මෙන්
ඇදේ උදේ බස් රිය වෙතට

සෙනෙහෙලතා රත්නායක
(ග්ලෙන් වැවලි)

